29 වන පිටෙන්

කුවේට් දේශයේ මුද්‍රණාලයේ පුරප්පාඩු පිරවීමට මම අත ඔසවා කැමැත්ත ප්‍රකාශ කළෙමි. එසේ වසර දෙකක් පමණ සේවයේ යෙදී සිටියදී, 1990 වසරේ අග බාගයේදී ඉරාකය විසින් කුවේටය ආක්‍රමණය කළේ පැය දෙකක් වැනි සුළු කාලයකදීය. එම අවස්ථාවේදී මාත්, මා සමඟ සිටි අනෙක් මිතුරන් සියල්ලන්ගේම එකම අරමුණ වූයේ ජීවිතය බේරාගැනීම පමණී. රැස්කළ භෞතික දේපළ මෙන්ම, එරට බැංකුවක තැන්පත් කළ මුදල්ද අහිමි වී ගිය මොහොතක, ඒ ගැන කිසිවක් නොසිතා ජීවිතය බේරා ගැනීමේ සටනක අපි සියල්ලම නිරතව සිටියහ.

ජාති ආගම් ආදියෙන් භේද බින්න වී යුද්ධයක් ඇති වුවද, එයින් විනාශවන්නේ ආදරණීය මනුෂ්‍යත්වයයි. ඉරාකය හා ඉරානය දීර්ඝ කාලීන යුද්ධයක නිරත වී සිටි අවධියක කුවේටය සහයෝගය දැක්වූයේ ඉරාකයටය. එම යුද්ධයේදී ඇමරිකාවේ ආශිර්වාදය හිමි වූයේද ඉරාකයටය. ඉරාකය හා ඉරානය අතර යුද්ධයේ නතරවීමත් සමඟ ඉරාකය, විසින් කුවේටය තමන්ගේ රටට හිමි කොටසක් බව පවසමින් අයිතිවාසිකම් ඉල්ලා සිටියේය. එම කලාපයේ වටිනාම තෙල් නිධිවලට හිමිකම් කියන කුවේටය අතීතයේදී ඉරාකයට අයත් කොටසක් හා එකම රටක් ලෙස තිබුණද, එය තෙල් නිධිවල වටිනාකම් අනුව මායිම් යොදා රටවල් දෙකක් කළේ අධිරාජ්‍යවාදීන්ය. ඒ ඔවුන්ගේ ඕනෑ එපාකම් හා තෙල් නිධි අයිතිය තම රටේ බහු ජාතික සමාගම් හරහා අත්පත් කර ගැනීමේ යටි අරමුණ ඇතිවය. ඉරාකය කුවේටය ආක්‍රමණය කළේ, අමෙරිකාවේ සහයෝගය ඔවුනට හිමිවේයැයි යන මූලික අරමුණ ඇතිවය. මන්ද ඒ වනවිට ඉරාකයේ තෙල් සම්පත් වැඩි ප්‍රතිශතයක් මිලදී ගත්තේ ඇමරිකානු හා බ්‍රිතාන්‍ය තෙල් සමාගම් නිසාය. එහෙත් ඒ සියලු අරමුණු උඩු යටිකුරු කරමින් සදාම් හුසේන්ට කුවේටය, ඉරාකය පමණක් නොව තමන්ගේ බලය හා ජීවිතයද අහිමි විය.

එම යුද්ධයේදී ඉරාකය විනාශ කළේ තම භාෂාව කතා කරන තමුන්ගේම ජාතියයි. මායිම් වැටකඩොලු හා තෙල් සම්පත් වෙනුවෙන් ඔවුන් විනාශ කළේ කාලයක් පුරා මිත්‍රතත්වයෙන් සිටි තමුන්ගේම අසල්වැසියන්වය. එතැනදී යුද්ධයට ජාතියක් ආගමක් බලපෑවේ නැත. බලපෑවේ වස්තුවයි. රටේ තිබූ ප්‍රබල සම්පතයි.

එකම භාෂාවක් කතා කරන, එකම ජාතියක් යුද්ධ කරන අයුරු දුටු මට එය නැවත සිහිගැන්වූයේ අප රට තුළ ඇති වූ යුද්ධයක් හා කළ කෝළහාල කිහිපයක් අතුරින් මෑතකදී නුවර ප්‍රදේශයේ ඇති වූ සිංහල මුස්ලිම් කෝළහලයයි. අප රටේ මුස්ලිම්වරුන් බොහෝ දුරට නෑකම් කියන්නේ අද ඉරාකය වී ඇති අතීතයේ අරාබි දේශයටය. නොයෙක් රටවල් තුළ සංක්‍රමණය වෙමින් ඔවුන් අපරට තුළට ගොඩ බසින්නේ කුළු බඩු හා රෙදි වෙළඳම හරහාය. ඒ ක්‍රිස්තු පූර්ව 800 900 ගණන්හි අබ්බාසිත් රජු කාලයේදීය. පුරුෂ ආධිපත්‍යට යටව තිබූ එම අවධිය තුළ රට රටවල් තුළ වෙළඳාම් සඳහා ගොඩ බැස්සේ පුරුෂ පක්ෂය පමණී. එකළ අප රටතුළ තිබූ දැඩි කුළ හා ජාති භේදය නිසා අඩු කුළ කාන්තාවන් සිටියේ අවිවාහකවය. එම කාන්තාවන් හා සම්බන්ධතා පවත්වමින් දරුවන් බිහි කරමින් එම වෙළෙන්දන් පසු කළක අපේ රටේ අපේම මිනිසුන් කොටසක් බවට පත්විය. කුළ මල භේදකම් නිසාම අපේම කාන්තාවන් මුස්ලිම් ආගම වැළඳ ගනිමින් ඔවුන් මුස්ලිම් සිංහල මිශ්‍රණයක් සහිත ශ්‍රී ලාංකිකයන් බවට පත්විය. අතීතයේ මුහුදු තීරයේ භාවිතා කළ දෙමළ බස ඔවුන්ගේ හුරු බස විය. එසේම එම වෙළෙන්දන් අපරට තුළට ගොඩ බැස්සේ දකුණු ඉන්දියාව හරහාය. ඒ වෙනස්කම් මගින් ඔවුන් දෙමළ බස හා සිහල බස කතාකරන ශ්‍රී ලාංකිකයන් විය. ශත වර්ෂ ගණනාවක් පරම්පරා කිහිපයක් බිහිකරමින් අපේම මිනිසුන් කොටසක් බවට පත් වූ ඔවුනට ඇති එකම භූමිය වන්නේ ශ්‍රී ලංකා භූමිය පමණී. අද එසේ සිංහල මුස්ලිම් වී ඇණකොටා ගන්නේ අපේ රටේම ශතවර්ෂ ගණනාවක සිට පෝෂණය වී අපේම මව්වරුන්ගේ කුසින් උපත ලද අපේම මිනිසුන්ය. රටතුළ වුවද, රටින් පිටවුවද මිනිසුන් මිනිසුන් අතර අනාධිමත් කාලයක සිටම සටන් පවතින්නේ භූමිය, ජලය හා සම්පත් වෙනුවෙනි. අප රට තුළ භාෂාවද අයත් විය. එසේ ඒ මිනිසුන්ම සියල්ල අතහැර ඒ පොළවටම පස් වෙන බව දැන දැනම ජාති ආගම් වෙනුවෙන් සටන් කරන්නේ කා වෙනුවෙන්ද ?
ඒ බලය රැකගෙන වැජඹෙන්නට දඟලන සුළුතර පිරිසක් වෙනුවෙනි. යුද්ධයකදි වීරයන් හා ද්‍රෝහියන් බිහි කරන්නේ උන්ගේ වාසිය හා පැවැත්ම වෙනුවෙනි.
කුවේට් දේශයේදී මා ඉපැයූ මුදලින් ගත් වතුර මෝටරයේ සිට ශීතකරණය හා මුදල්ද මංකොල්ල කෑ ඉරාක්හි වෙසෙන දුගී දුප්පත් හමුදා භටයා සේම, මෑතකදී රටතුල වූ කෝළහාල වලදී අසරණ මිනිසුන්ගේ දේපළ මංකොල්ල කෑ ජාත්‍යාලවාදීන්ගේද අවසන් තුරුම්පුව වන්නේ ජාතිය වෙනුවෙන් අසරණයන් සතු දෑ සොරකම් කර ජීවත්වීමයි. වැඩි ප්‍රතිශතයක් බුදුදහම අදහන රටක් වශයෙන් එතනදී මනුෂ්‍යත්වයට හිමිවන තැන කුමක්ද? අප එය සිතට ගෙන මනුෂ්‍යත්වයේ නාමයෙන් ජාතියකින් ආගමකින් තොරව මිනිසත්කමේ අගය රැකගත යුතුය. බුදුන්, ජේසුන්ගේ හා අල්ලා දෙවියන් දක්වා කියාදෙන්නේ ඒ මිනිසත්කමේ අගයයි. අහසේ පායන පුන්සඳ වෙසඟට මෙන්ම රාමදාන් උත්සවයට පායමින් කියන්නේ ඒ මිනිසත්කම රැකගන්නට කරන ඇරයුමයි. හිරු, සඳු, තරු එළිය මේ මිහිකතට හා අහස්තලයට පායමින් කියන්නේ මේ පොළවේ උපදින සියල්ලේම අයිතිය කිසිවකුටත් හිමි නොවන බවයි. මේ වෙසගේ අපි සිහි තබාගත යුත්තේ ආදරණීය මනුෂ්‍යත්වයට ආදරය කරමින් අප සියල්ලෝම එකම රටක්, එකම ජාතියක් ලෙසින් ආදරයෙන් ජීවත් විය යුතු බවයි. එහෙත් එය එසේ සිදුනොවන තත්ත්වයට රට පත්කර ඇත්තේ කවුරුන්ද?. බුදුන් වඳිමින් ඒ ගැනද සිතන්න.



## සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website:
Visit www.sannasa.com.au









